2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යාවේ ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2012 ජූලි 10
ලියාපදිංචි කාර්යාලය : අංක 105/සී/11, "බෙතෙල්", මැතිව් මාවත, ඒකල, ජාඇල.
ලියාපදිංචි අංකය : පී වී 86949.

ජී. සමරසේකර,
සමාගම් ලේකම්.

08-580

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඉ සයිබ සෙක් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 87216
ලියාපදිංචි ලිපිනය : අංක 02, පළමු මහල, රොක්වුඩ් පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි දිනය : 2012.07.24.

අධ්‍යක්ෂ මණ්ඩලය.

08-583

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි:-

1. සමාගමේ නම : එම්. ජේ. එම්. ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2012 ජූලි 25
3. සමාගමේ අංකය : පී. වී. 87257
4. ලියාපදිංචි ලිපිනය : අංක 30/10, හුලුදාගොඩ පාර, ගල්කිස්ස.

එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

08-584

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ:-

සමාගමේ පැවති නාමය : ජෙනුඉන් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නාමය : ජෙනුඉන් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 64407
ලියාපදිංචි කාර්යාලය : අංක 93- 1/1 දෙවැනි මහල, සෙන්ට්‍රල් ප්ලාසා, මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10
නාමය වෙනස් වූ දිනය : 2012 ජූලි 24
ඉදිරිපත් කිරීම : ජෙනුඉන් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ.

08-588

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳව නිවේදනය කිරීම

සමාගමේ නම : ජෙනේසස් ස්ටුඩියෝස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 87344
ලියාපදිංචි කාර්යාලය : අංක 404, බී, තිඹිරිගස්යාය පාර, කොළඹ 05
සංස්ථාගත කිරීමේ දිනය : 2012 ජූලි 31.
ඉදිරිපත් කිරීම

සමාගම් අධ්‍යක්ෂ.

08-589

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කැන්රෝ ඉන්ටීරියස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 86985
ලියාපදිංචි කළ දිනය : 2012 ජූලි මස 11
ලියාපදිංචි කාර්යාලය : අංක 7 ඒ, අංගමුව පාර, අරුක්වත්ත, පාදුක්ක.

කාංචනා ෂ්‍යාමින් සැල්වඩෝර්
කැන්රෝ ඉන්ටීරියස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

08-590

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම පනත යටතේ 9 (1) වගන්තිය අනුව සමාගමේ නම වෙනස් කිරීම පහත පරිදි වේ :-

1. නව සමාගම් නාමය : ස්ටැන්ඩර්ඩ් එඩියුකේෂනල් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ලියාපදිංචි කළ දිනය : 2010 අගෝස්තු 04
3. සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 73597
4. සමාගමේ ලියාපදිංචි කළ කාර්යාල ලිපිනය : අංක 6- 1/1, 37 වැනි පටුමග, කොළඹ 06.

ආයතන ලේකම්.

08-591

---

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි:-

සමාගමේ නම : කනු ෂිපිං ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 87221
සංස්ථාගත කළ දිනය : 2012 ජූලි 24
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ලෙවල් 06, ඇක්සස් ටවර්ස්, අංක 278, යූනියන් පෙදෙස, කොළඹ 02.

අධ්‍යක්ෂ.

08-568

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඒ. වී. එස්. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 87041
ලියාපදිංචි දිනය : 2012.07.13
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 34, ජයන්ති විද්‍යාල මාවත, නාම්පමුණුව, පිළියන්දල.

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම,
සමාගම් ලේකම්වරු.

08-599

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු :-

සමාගමේ නම : ලක්වින්ස් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 86575
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 432/9, අඩියාමුල්ල, කිරිවත්තුඩුව, ශ්‍රී ලංකාව.

08-598

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙම නිවේදනයෙන් දන්වනු ලැබේ:-

සමාගමේ නම : ක්ලියර් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 87201
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 12- 01, ඊස්ට් ටවර්, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01
සංස්ථාගත කළ දිනය : 2012.07.24.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

08-581

### නිවේදනයයි

සෙකට්රීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර් (ප්‍රයිවට්) ලිමිටඩ් සිය නාමය 2012 ජූලි 18 වැනි දින සිට කේ. පී. එම්. ජී. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කේපීඑම්ජී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 479
ලියාපදිංචි කාර්යාලය : අංක 32 ඒ, ශ්‍රීමත් මොහමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඩී. කේ. ජයවර්ධන,
ලේකම්.

08-629

---

### දැන්වීමයි

ඔෂියන්පික් (ප්‍රයිවට්) ලිමිටඩ්

2011 දෙසැම්බර් මස 06 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඔෂියන්පික් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 82933
ලියාපදිංචි කාර්යාලය : අංක 425, 15 හැව්ලොක් පාර, කොළඹ 06.

මැනේජ්මන්ට් එකවුන්ටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

08-620

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : පැක් ලංකා හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 87109
සංස්ථාගත කළ දිනය : 2012 ක් වූ ජූලි මස 30 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 23 ඒ, සයිමන් අබේවික්‍රම මාවත, ගල්කිස්ස.

එන්. ජී. එච්. එස්. ද සිල්වා,
සමාගම් ලේකම්.

08-615

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි :

සමාගමේ නම : පැරඩයිස් එස්කපේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පි වී 87387
සංස්ථාගත කළ දිනය : 2012 අගෝස්තු 02 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 55/51, 10 වැනි පටුමග, දකුණ වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂක.

08-652

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියේ විධිවිධානවලට අනුව කැපිටල් ඩිවලොප්මන්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි පීඑල්සී හි නම පහත සඳහන් ආකාරයෙන් වෙනස් වී ඇති බවට අප මේ මගින් දැනුම් දෙමු.

කලින් නම : කැපිටල් ඩිවලොප්මන්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි පීඑල්සී
සමාගමේ අංකය : පි බී 110
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40, නවම් මාවත, කොළඹ 02
සමාගමේ නව නාමය : එන්ඩීබී කැපිටල් හෝල්ඩින්ස් පීඑල්සී

මණ්ඩලයේ අණ පරිදි,

මනික් කිරිඇල්ල බණ්ඩාර,
සමාගම් ලේකම්.

08-648

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව අයි එෆ් සී ඕ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2012 ජූලි මස 25 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : අයි එෆ් සී ඕ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 87290
ලියාපදිංචි ලිපිනය : අංක 27, පැපිලියාන පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සෙක්‍රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-630

---

### සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ඉන්ටර් ඒසියා මාකර්ටිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 87073
සංස්ථාගත කළ දිනය : 2012.07.13
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 54, අම්පාර පාර, අක්කරෙයිපත්තු -06/KT/21, අම්පාර.

සමාගම් අධ්‍යක්ෂකවරු.

2012 ජූලි මස 16 වැනි දින.

08-661

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ජේවූන් බිල්ඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 87212
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 33, යටාලතිස්ස මාවත, කැලණිය
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.07.24.

08-653/1

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ග්‍රීන් මෙඩිකෙයා හොස්පිට්ල් (පීවීටී) එල්ටීඩී
සමාගම ලියාපදිංචි අංකය : පී වී 75525
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 213, නවනගරය, ඇඹිලිපිටිය
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.11.16

08-653/2

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ජ්ස් ගෘප් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 87357
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 40, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.08.06.

08-653/3

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : නිව් පාල මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 87170
සංස්ථාගත කළ දිනය : 2012.07.20
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 167/2, ලක්ෂ්මී පාර, බැන්ඩියමුල්ල, ගම්පහ.

මද්දුමගේ රත්නපාල,
අධ්‍යක්ෂ.

අංක 167/2, ලක්ෂ්මී පාර,
බැන්ඩියමුල්ල,
ගම්පහ.

08-696

## නිවේදනයයි

පහත සඳහන් සමාගම 2012.05.23 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සීමාසහිත රන් පොලිමර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 86140
ලියාපදිංචි කාර්යාලය : අංක 182, පලුගම, දොම්පෙ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත බිස්නස් සෙකටේරියල් සර්විසස්
(පෞද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු. පී. වී. 13045.

08-686

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව 2011 ජුනි මස 28 වැනි දින ෆයින් ටෙක්නොලජීස් ඉන්ටනැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව දන්වා සිටිමු.

සමාගමේ නම : ෆයින් ටෙක්නොලජීස් ඉන්ටනැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 79677
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 544, කෝට්ටේ පාර, ඇතුල් කෝට්ටේ.

ඩිරෙක්ටර්.

08-667

## පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදය ප්‍රකාර ඒකාබද්ධ කිරීම

**කැළණි වැලි ග්‍රීන් ටී (ප්‍රයිවට්) ලිමිටඩ්**
(සමාගම් අංක පී වී 4816)

**කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී**
(සමාගම් අංක පීකිව් 58)

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 ඡේදයේ නියමයන්ට අනුකූලව කැළණි වැලි ග්‍රීන් ටී (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පීවී 4816) සහ කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී (සමාගම් අංක පීකිව් 58) යන සමාගම් ද්විත්වය එක සමාගමක් ලෙස ඒකාබද්ධ කරන ලද බව සමාගම් පනතේ 244(3) ඡේදය යටතේ මින් දැනුම් දෙනු ලැබේ. ඒකාබද්ධ සමාගමේ නාමය කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී වන අතර, එකී ඒකාබද්ධ කිරීම සමාගම් පනතේ නියමයන්ට අනුකූලව සම්පූර්ණ කර ඇත.

ඒ අනුව සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල් විසින් 2012 ජුලි මස 23 වැනි දින සමාගම් පනතේ 244 (1) (අ) යටතේ ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.
2012 ජුලි මස 31 වැනි දින.

08-666

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : සඳ ලංකා ටයිල්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගමේ අංකය : පී වී 72290
ලියාපදිංචි කාර්යාල : අංක 630, මල්වාන හින්න, අකුරණ
සංස්ථාපනය කළ දිනය : 2010 මැයි 12.

ජේ. එම්. හිලාල්,
අධ්‍යක්ෂක.

08-750

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) සහ 9 (1) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ පෙර නාමය : ලංකා ලෙෂර් රිසෝට්ස් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : එජ් ලෙෂර් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 2917
ලියාපදිංචි දිනය : 2012 මැයි 09 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 31, ලෙයාඩ්ස් පාර, කොළඹ 05.

සමාගමේ පෙර නාමය : ට්‍රොපිකල් ට්‍රෙෂර් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : කින්ඩම්ස් ඒජ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 81376
ලියාපදිංචි දිනය : 2012 ජුනි 05 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 31, ලෙයාඩ්ස් පාර, කොළඹ 05.

සමාගමේ පෙර නාමය : ලයිෆ් ලෙෂර් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : කලම්බු සිටි ඒජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 80251
ලියාපදිංචි දිනය : 2012 ජුනි 08 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 31, ලෙයාඩ්ස් පාර, කොළඹ 05.

සමාගමේ නාමය : මැනා රිෆයිනරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 86568
ලියාපදිංචි දිනය : 2012 ජුනි 15 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 154, ගාලු පාර, කොළඹ 04.

අරුණි සැන්ඩ්‍රුස්,
නීතිඥ සහ නොතාරිස්.

08-751

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ප්ලම්බේගො ලංකා (පී. වී. ටී.) එල්. ටී. ඩී.
2. සංස්ථාගතක ළ දිනය : 2012 ජූලි 31
3. සමාගම් අංකය : පී වී 87270
4. ලියාපදිංචි ලිපිනය : අංක 41, ජනාධිපති මාවත, කොළඹ 01.

ලේකම්.

08-715

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගම් නාමය : රජගෙදර (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 60281
ලියාපදිංචි කළ දිනය : 2007.06.15
ලියාපදිංචි ලිපිනය : අංක 315/2, හයිලෙවල් පාර, මහල් වරාව, පන්නිපිටිය

ගීතා පද්මිණී විජේසිංහ,
කේ. එම්. ආර්. කිරිදිගල.
අධ්‍යක්ෂ.

08-731

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය අනුව පහත නම සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2012 ජූලි 31 වැනිදා සිට සිය නාමය වෙනස් කර ඇති බව මෙයින් ප්‍රසිද්ධ කර දන්වා සිටිනු ලැබේ.

නව නාමය : පබ්ස් එන් ප්ලේසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පෙර නාමය : සී බී එල් රිටේලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 61888
ලියාපදිංචි කාර්යාලය : අංක 61, ජනාධිපති මාවත, කොළඹ 01.

කාසන්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 අගෝස්තු මස 24 වැනි දින,
අංක 61, ජනාධිපති මාවත,
කොළඹ 01.

08-714

## දැන්වීමයි

එන්. එස්. කේ. ෆයිනෑන්ෂියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, යන සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත ට යටත් ව, 2009 මැයි මස 28 වැනි දින සමාගම් අංක පී. වී. 67924 යටතේ ආරම්භ කර අංක 266, යුනියන් පෙදෙස, කොළඹ 02 ස්ථානයේ දැනට පවත්වා ගෙන යන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

08-732

## සංස්ථාගත කිරීමේ දැන්වීමයි

මැග්නම් හෝල්ඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2011 මාර්තු මස 17 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : මැග්නම් හෝල්ඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 77092
ලියාපදිංචි කළ කාර්යාලය : වැලියන්ට් ටවර්ස්, ලෙවල් 3 සී, අංක 46/7, නවම් මාවත, කොළඹ 02.

08-736

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**2013 වර්ෂය සඳහා රට බීම තැබෑරුම් රේන්ද විකිණීම - කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2013 ජනවාරි මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(i) 1982.08.20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පෙනෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන 'එෆ්' තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතිකය නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතික වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ "2013 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක.............................. දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යි යන්න සඳහන් ටෙන්ඩර් පත්‍ර, තැබෑරුමේ නමට කෙළින් පහත දක්වා තිබෙන වේලාවන් සහ දිනයන් හි දී ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසන් වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුයි.

04. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදල තැන්පත් මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර ඔහුගේ ම නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි කරුණක් නොදක්වා ම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

07. 2012 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එකී ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ:-

උපලේඛනය

| *(ඒ)* | *(බී)* | *(සී)* | *(ඩී)* | *(ඊ)* | *(එෆ්)* | *(ජී)* | *(එච්)* |
|---|---|---|---|---|---|---|---|
| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය බල ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු.* | *ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව* | *විකිණීම කරන දිනය* |
| 1. | අංක 13 කොට්ඨාසය කොටුව | *(ඒ)* ක්වීන් වීදියේ සහ යෝක් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ බේලි වීදිය පෙදෙස<br>*(බී)* කැනල් රෝ සහ චර්ච් සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ යෝක් වීදියේ බටහිර පෙදෙස | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | ප. ව. 2.00 සහ ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2012.09.12 |

| (ඒ) | (බී) | (සී) | (ඩී) | (ඊ) | (එෆ්) | (ජී) | (එච්) |
|---|---|---|---|---|---|---|---|
| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය බල ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු.* | *ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව* | *විකිණීම කරන දිනය* |
| | (සී) | යෝක් වීදියේ සහ ප්ලැග්ස්ටොප් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ චැතැම් වීදියේ දෙපස පෙදෙස, චර්ච් වීදියේ සහ චැතැම් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ ක්වීන් වීදියේ නැගෙනහිර පෙදෙස | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | ප.ව. 2.00 සහ ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2012.09.12 |
| 2 | අංක 2 කොට්ඨාසය මෝදර | පෙදෙස මෙසේ සීමා වී තිබේ.- උතුරට : අලුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ද, නැගෙනහිරට : පහළ ශාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට අලුත් මාවත පාරේ බටහිර පෙදෙස ද, දකුණට : ශාන්ත ඇන්ඩෘගේ පාරේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට පහළ ශාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ උතුරු පෙදෙස ද, බටහිර මාලේ වීදියේ සහ පහළ ශාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ශාන්ත ඇන්ඩෘ පාරේ නැගෙනහිර පෙදෙස සහ මාදම්පිටිය හා මාලේ වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ මෝදර වීදිය නැගෙනහිර පෙදෙසත් ය. | එම | එම | එම | එම | එම |

09. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

10. *වැදගත්* .- 2012.09.12 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2012.11.07 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. ජී. ධර්මතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2012 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-737/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ජී. වී. සී. එම්. ආරච්චි.
ගිණුම් අංක : 0033 5001 0911.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.04.27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් හය ලක්ෂ පනස් දෙදහස් හාරසිය හතලිස් එකයි ශත අසූ එකක (රු. 36,52,441.81) මුදලක් 2009 නොවැම්බර් මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස් හය ලක්ෂ පනස් දෙදහස් හාරසිය හතලිස් එකයි ශත අසූ එකක (රු. 36,52,441.81) මුදල ද 2009 නොවැම්බර් මස 17 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු

ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2010.07.19 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2012.09.14 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ දකුණු උඩ පත්තුවේ අමුටගොඩ ග්‍රාමයේ පිහිටි "කටවලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. පී. එස්. රාජපක්ෂ යන අය විසින් සාදන ලද 2007 අගෝස්තු මස 02 දාතම හා අංක 2650 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කනත්ත, නැගෙනහිරට : අංක 2794 දරන පිඹුරේ ලොට් 1 සහ 8 දකුණට : පාර සහ බස්නාහිරට : අංක 2794 දරන පිඹුරේ ලොට් 10 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හයක් (අ. 0, රූ. 1, පර්. 6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2650 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 485/269 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-710

---

### මහජන බැංකුව - පානදුර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

*වටිනා දේපළක් .-* බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, වාද්දු වස්කඩු දෙබැද්දේ, මහ වාද්දුව (බස්නාහිර) පිහිටි වාද්දුවේ නගර සභා බල සීමාව තුළ පිහිටි "කිරිපැල්ලගහවත්ත" නමැති ඉඩමේ "ඩී" දරන කැබැල්ල හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් විසි හතයි දශම පහක් (අ. 0, රූ.0, පර්. 27.5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලුම ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලුම දේ ද වේ. (මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 137/266 හි ලියාපදිංචි කර ඇත)

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2012 ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* වර්ෂ 2010.09.03 වැනි දින ද, 2010.08.18 වැනි දින දිනමිණ සහ ඩේලි නිව්ස් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම. -* පානදුර සිට වාද්දුව දෙසට යන විට ගාළු පාරේ වාද්දුව නගරයට මීටර් 200ක් පමණ පානදුර දෙසට වන්නට පාරේ දකුණු පස ඇති වෙරළ පාරේ මීටර් 75ක් පමණ ඉදිරියෙන් පාරේ දකුණු පස අංක 16 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත. දේපළට වාහනයකින් පිවිසිය හැක. ප්‍රවේශ බාධක නොමැත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකාර මහතා, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කළුතර) අංක 341, ගාලු පාර, පානදුර වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක 033-2232438, 038- 2241596, 038-4283182, 038-2235401 ෆැක්ස් අංකය 038- 2232727. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කෙමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම)

කාර්යාලය : අංක 25 "බී" බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356, 071-8760986
ෆැක්ස් අංකය : 011-2334808
නිවස : අංක 11/55. කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංකය : 011 - 2419126.

08-709

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෝමාගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ ගම හොරණ ප්‍රාදේශීය සභාවට අයිති කන්නන්විල උප කාර්යාලය සීමාව තුළ පහළ මිල්ලෑව ගමෙහි පිහිටි යහලකැලේ එස්ටේට් (හල්බරාව අරලිය කොටස) නමැති ඉඩමට බලයලත් මානක එච්. පී. ඒ. ජයවික්‍රම විසින් මැන සාදන ලද අංක 7351 සහ 2003.04. 28 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 18 දරන ඉඩම.

ප්‍රමාණයෙන් : රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 1, පර්. 38.08)

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය යටතේ වර්ෂ 2012 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1978 සහ 2007.04.17 වැනි දින දරන ණය බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සරත් සතරසිංහ (වඩා නිවැරදිව දොන් සරත් සතරසිංහ) සහ මාලා මංගලිකා බමුණුආරච්චි (හවුල්කරුවන් : සතරසිංහ එන්ටර්ප්‍රයිසස්) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්

වැඩිදුර විස්තර සඳහා 2009.11.13 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2009.11.17 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - ගොඩගම මංසන්දියේ සිට පාදුක්ක දෙසට කි. මී. 03ක් පමණ ඉදිරියට පැමිණෙන විට හමුවන වටරුක දුම්රිය ස්ථානය අසලින් දකුණට ඇති හොරගල පාරේ (හලබරාව පාර, මඩුලාව පාර) තවත් කි. මී. 4.5ක් පමණ ඉදිරියට පැමිණි පසු (හොරගල හන්දියේ සිට කි. මී. 1/2ක් පමණ) පාරේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැනුම් මිලෙන් 10% ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති 10% මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාල ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දාන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661826.

ශ්‍රීයාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 0713 - 151356.

08-718

---

**මහජන බැංකුව - මහනුවර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟ පළාතේ, දෙහිගම පිහිටි බලයලත් මිනින්දෝරු පී. සී. ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් 1997.08.07 වැනි දින මැන සාදන ලද අංක 1327 දරන පිඹුරේ කැබලි අංක 02 වශයෙන් සළකුණු කොට ඇති රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම පහක් (අක්. 0, රූ. 01, පර්. 33.5) විශාල කටුකන්දෙනිය හා බණ්ගේතැන්නහේන නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ඉඩම් සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ ද සමග මහජන බැංකුව විසින් අපවෙත පවරන ලද බලය මත අප විසින් 2012 සැප්තැම්බර් මස 18 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ ගැසට් පත්‍රයේ 2008.02.22 වැනි දින ද, ඩේලි නිවුස් පුවත්පතේ 2008.02.13 වැනි දින ද, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2009.10.16 වැනි දින ද, පළකර ඇති දේපළ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- මහනුවර කොළඹ පාරේ පේරාදෙණිය නගරය පසුකර පොල්ගහමුල හංදිය දක්වා පැමිණි විට එම මාර්ගයේ දකුණට ඇති මුරුතලාව පාරේ මුරුතලාව කඩමණ්ඩිය තෙක් ගිය විට වමට ඇති පිළිමතලාව දෙසට යන පාරේ කි. මී. 01ක් පමණ යන විට දෙහිගම නමැති ගමේ කෙළවරේ හමුවන පාලම අසල දකුණු පසින් ඉහත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංකය : 081- 2234283
ෆැක්ස් අංකය : 081- 2223017.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින

30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10 % ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත ISO 9001 : 2000 සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ/තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593, 081-2224371
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,

*නව නාගරික කාර්යාලය හා ප්‍රදර්ශන ශාලාව :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011- 2585408,- 2502680,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

08-744

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.